# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1798/12 - 2013 පෙබරවාරි මස 18 වැනි සඳුදා - 2013.02.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත**

14 වැනි වගන්තියේ (03) වැනි උපවගන්තිය යටතේ වන නිවේදනය

**මත්තල රාජපක්‍ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළෙහි ගුරු සැලැස්ම සඳහා අනුමැතිය**

2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 14 වැනි වගන්තිය යටතේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ලුණුගම්වෙහෙර සහ හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස බල ප්‍රදේශ තුළ ඉදිකරනු ලැබ ඇති මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි ගුරු සැලැස්ම සිවිල් ගුවන් සේවා අධිකාරිය මගින් පහතින් දක්වා ඇති කොන්දේසි වලට යටත්ව අනුමත කර ඇති බව මහජනතාවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

1. ගුවන්තොටුපළ ගුරු සැලැස්ම ගුවන්තොටුපළ සම්බන්ධ සවිස්තර අධ්‍යයනයක් වන අතර අනාගත ගුවන් සේවා ඉල්ලුම සපුරාලීම සම්බන්ධ කෙටිකාලීන, මධ්‍යකාලීන සහ දිගුකාලීන සංවර්ධන සැලසුම් මගින් ද ගුවන්තොටුපළ සංවර්ධනය සඳහා වූ අයදුම්කරුගේ මූලෝපායන්ගෙන් ද යුක්ත වේ. ගුරු සැලැස්මේ අරමුණ වන්නේ විභව්‍ය පාරිසරික සහ සමාජ ආර්ථික බලපෑම සම්බන්ධව සැලකිල්ලට ගනිමින් ගුවන් තොටුපළ අනාගත සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය වන රාමුව ගුවන් සේවා ඉල්ලුම ඵලදායී ලෙස සපුරාලීමය.

   මේ සම්බන්ධව ගුවන් තොටුපළ හා ගුවන් සේවා සමාගම අවශ්‍ය සංශෝධන සහ යාවත්කාලීන කිරීම මගින් නිසි සම්ප්‍රජන්‍යතාවයෙන් පසු හම්බන්තොට  මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපලෙහි ගුරු සැලැස්ම වර්තමාන අනවරතයෙන් පවතින බව සහතික කළ යුතු වේ.

2. ගුරු සැලැස්ම සමාලෝචනය හෝ යාවත්කාලීන කිරීම සඳහා ගුවන් තොටුපළ හා ගුවන්සේවා සමාගම ගුවන් සේවා ගමනාගමන පුරෝකතන සහ විකල්ප සංවර්ධන සංකල්පයන් සඳහා අදාළ විය හැකි පාරිසරික හා සමාජ ආර්ථික පිරිවැය සහ සංවේදී සම්පත් මඟහැරීම, අඩුකිරීම සහ ලිහිල් කිරීම සම්බන්ධව විය හැකි උපක්‍රම අනාගත පහසුකම් සැලසුම් කිරීමේ අදාළ සවිස්තරාත්මක මිම්ද සලකා බැලීම මගින් පාලනය කිරීම සිවිල් ගුවන් සේවා අධිකාරියේ අවශ්‍යතාවය වේ.

3. ගුවන් තොටුපළ සහ ගුවන් සේවා සමාගම මගින් ආවර්ථික සමාලෝචන සහ යම් තැනක අවශ්‍ය අනිවාර්යය යාවත්කාලීන කිරීම තුළින් මත්තල රාජපක්ෂ ගුවන් තොටුපළෙහි ගුරු සැලැස්ම නොනැවතී අඩුතරමින් පහතින් දක්වා ඇති අරමුණු සුරක්ෂිත කළ යුතු ය.

(අ) යෝජිත සංවර්ධනයේ ආමන්ත්‍රණය කරන දෑ ගුරු සැලැස්මෙහි ලේඛනගත කොට තිබීම.

(ආ) අදාළ තාක්ෂණික, ආර්ථික සහ පාරිසරික සමීක්ෂණ සංකල්ප සහ විකල්ප තුළින් ගුරු සැලැස්මෙහි යෝජිත සංවර්ධන යුක්තිමත් කිරීම.

(ඇ) ගුවන්තොටුපල සංවර්ධනය සහ ගුවන්තොටුපළ අවට අපේක්ෂිත භූමි පරිභෝජනය සඳහා ගුරු සැලැස්ම මගින් ඵලදායී ප්‍රස්ථාරික ඉදිරිපත් කිරීම් කර තිබීම.

(ඈ) ගුරු සැලැස්ම මගින් සැලැස්මේ යෝජිත සංවර්ධනය ක්‍රියාත්මක කිරීම සඳහා තාත්වික න්‍යායපත්‍රයක් ස්ථාපිත කොට තිබීම සහ විශේෂයෙන්ම කෙටිකාලීන ප්‍රාග්ධනය වැඩි දියුණු කර ගැනීමේ වැඩසටහනක් ස්ථාපිත කිරීම.

(ඉ) ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන් සඳහා ආධාර වන ඒ සඳහා ළඟාවිය හැකි මුල්‍ය විසඳුම් ගුරු සැලැස්ම මගින් යෝජනා කොට තිබීම.

(ඊ) ගුවන්තොටුපළෙහි අනාගත පුළුල් කිරීම් ඇරඹීමට පෙර සිදුවන පාරිසරික ඇගයීමක් කිරීමේ අවශ්‍යතාවය සඳහා ප්‍රමාණවත් විග්‍රහයක් සහ විස්තර ගුරු සැලැස්ම මගින් සලසා තිබීම.

(එ) වර්තමාන ප්‍රාදේශීය පාලන, පළාත් සභා සහ රාජ්‍ය රෙගුලාසි සපුරාලන සහ ප්‍රමාණවත්ව ආමන්ත්‍රණය කරනු ලබන සැලසුමක් සහිත ගුරු සැලසුමක් ඉදිරිපත් කර තිබීම.

(ඒ) වියදම් කිරීම, ණය, භූමි පරිභෝජනය පිළිබඳ වූ පාලන මාර්ග සහ ගුවන් තොටුපළ සහ එහි වටපිටාවෙහි සම්පූර්ණත්වය සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය අනෙකුත් ප්‍රතිපත්ති සඳහා වූ නාගරික හෝ ප්‍රාදේශික විචාරයන් සඳහා ආධාර වන්නා වූ අනාගත ගුවන් සංතරණ ඉල්ලුම සහ ප්‍රතිපත්ති ගුරු සැලැස්මෙහි ලේඛනගත කොට තිබීම.

(උ) ගුරු සැලැස්ම මගින් සන්තන සැලසුම්කරණ ක්‍රියාවලියක් සඳහා සුදුසු රාමුවක් සකස් කිරීම සහ සංස්ථාපනය කර තිබීම. එම ක්‍රියාවලිය ප්‍රධාන තත්ත්වයන් අධ්‍යයනය සහ අවශ්‍ය පරිදි සැලසුම් නිර්දේශයන්හි වෙනස්කම් අනුමත කිරීම කළ යුතු ය.

4. ගුවන් තොටුපළ හා ගුවන් සේවා සමාගම විසින් ගුවන් තොටුපළ හා ඒ අවට වැදගත් වන සංවර්ධන කටයුතු සම්බන්ධ සත්‍ය වූ හෝ සැලසුම්ගත වෙනස් කිරීම් පැහැදිලිව නිරූපනය වන පරිදි යාවත්කාලීන ගුවන්තොටුපළ පිරිසැලසුම් පිඹුරුපත් කට්ටල පිහිටුවීම හා එම සැලසුම් යාවත්කාලීනව දිගටම පවත්වාගෙන යාම කළ යුතු ය. එම ගුවන් තොටුපළ පිරිසැලසුම් විස්තර වාර්තාවේ අවම වශයෙන් පහත දැක්වෙන අංගයන් ඇතුළත් විය යුතු ය.

(අ) මූලික ගගන නාවික පුරෝකතනයන් ;

(ආ) යෝජිත සංවර්ධන අංගයන් සඳහා වූ මූලාධාරයන් ;

(ඇ) ගුවන් තොටුපළ සැලසුම් පිළිබඳ ගුවන් සේවා අධිකාරිය විසින් පනවන ප්‍රමිතීන්ට පරිබාහිර වූ අනියම් සැලසුම් අංගයන් සහ/හෝ වෙනස් කිරීම් වේ නම් ඊට පාදක වූ හේතුකාරණා;

(ඈ) ගුවන් තොටුපළ සංවර්ධනය සම්බන්ධ විවිධ අදියරයන් පිළිබඳ සාරාංශය සහ එම එක් එක් අදියරයන්හි ප්‍රධාන සංවර්ධන අංගයන් පිළිබඳ පිරිසැලසුම් සටහන්.

ගුවන් තොටුපළ පිරිසැලසුම් පිඹුරුපත් කට්ටල, මුල් ගුරු සැලැස්ම සඳහා යෝග්‍ය විකල්පයක් වේ. ගුවන් තොටුපළ ක්‍රියාකාරිත්වයේ හෝ වැඩිදියුණු කිරීම් වල සැලකිය යුතු වෙනස් කිරීම් නොමැති විට හෝ එම වෙනස් කිරීම් හේතුවෙන් ප්‍රතිවිකාශනයන් ඇති නොවන විටදී ගුරු සැලැස්ම සඳහා යාවත්කාලීන කිරීම් අවශ්‍ය නොවේ. නමුදු ධාවනපථ ආරක්ෂිත ප්‍රදේශය වැඩිදියුණු කිරීම වැනි ඒකල සංවර්ධන අංගයන් සැලකූවිට එය පරීක්ෂාව සඳහා උක්ත යාවත්කාලීන ගුවන්තොටුපළ පිරිසැලසුම් පිඹුරුපත් කට්ටල පමණක් සුදුසු වන අවස්ථා ද, ඉහතින් දක්වා ඇති පරිදි යාවත්කාලීන ගුවන් තොටුපළ පිරිසැලසුම් සටහන් සම්පූර්ණ ගුරු සටහන් සැලැස්ම මෙන් නොව පහත අංගයන් කිහිපයකම පමණක් එනම් අනාගත ගුවන් සේවා ඉල්ලුම පිළිබඳ අනාවැකි අනෙකුත් පහසුකම්වල අවශ්‍යතා පිළිබඳ ඇගයීම් එම පහසුකම් සැපයීම ක්‍රියාත්මක කිරීම සහ ඒ සම්බන්ධ මූලධර්ම සැලසුම් සහ ගුවන්තොටුපළ පිරිසැලසුම් පිඹුරුපත් කට්ටල සඳහා දර්ශීයව නියමානුකූලව සම්බන්ධ වේ. නමුත් ගුවන් තොටුපළ පිරිසැලසුම් සටහන් යාවත්කාලීන කිරීමට, අමතර පියවර අවශ්‍ය වන විටක දී සම්පූර්ණ ගුරු සැලැස්ම පිළිබඳ අධ්‍යයයනයක් කිරීම අවශ්‍ය වන්නේ ය.

5. තවද ගුවන්තොටුපළ සම්බන්ධ ගුවන්තොටුපළ හා ගුවන් සේවා සමාගමේ අදහස්, ප්‍රතිපත්තීන් සහ සංවර්ධන සැලසුම් ගුවන් තොටුපළ ගුරු සැලැස්මෙහි අන්තර්ගතය තුළ ඉදිරිපත් කළ යුතු අතර සිවිල් ගුවන් සේවා අධිකාරියෙහි රාජකාරිමය නියමයන් සහ අදහස් සමග ප්‍රතිවිරුද්ධ නොවිය යුතු ය. තවද සිවිල් ගුවන් සේවා අධිකාරිය මගින් ගුවන් තොටුපළ ගුරු සැලැස්ම අනුමත කළ පමණින් එම සැලැස්මේ නිරූපිත ස්ථාපනය කිරීම සඳහා කිසිවෙකුට විධානයක්, අවසරයක් ලබා දුන් බවට හෝ දැනට පවතින අදාළ නීති රීතිවලට අනුකූලව යෝජිත සංවර්ධන කටයුත්ත, පාරිසරික බලපෑම අතින් පිළිගත හැකි බවට ගම්‍ය නොවේ. සිවිල් ගුවන් සේවා අධිකාරිය මගින් ගුරු සැලැස්ම සමාලෝචනය කරනුයේ එය පූර්ණ සැලසුම් ක්‍රමවේදයක් භාවිතා කර ඇති බවට තහවුරු කිරීමට වන අතර සහ එහි පහත සඳහන් අංගයන් පමණක් අනුමත කරනු ලැබේ.

(අ) ඉල්ලුම පිළිබඳ පුරෝකතනයන් මෙහිදී පාදක වූ උපකල්පන සහ පුරෝකතන ක්‍රමෝපායන්හි අදාළතාව සහතික කරනු ලැබේ ;

(ආ) ගුවන්තොටුපළ පිරිසැලසුම් පිඹුරුපත් ගුවන් තොටුපළ සම්බන්ධ සියළු සංවර්ධන කටයුතු සිදුකළ යුත්තේ සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් අනුමත ගුවන්තොටුපළ පිරිසැලසුම් පිඹුරුපත් වලට අනුකූලව ය.

උක්ත අනුමැතිය මගින් ගුවන්තොටුපළ පිරිසැලසුම් පිඹුරුපත්වල දක්වා ඇති දැනට පවතින සහ යෝජිත සංවර්ධන කටයුතු එම අනුමැතිය ලබා දෙන අවස්ථාවේ සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් නිකුත් කළ ගුවන් තොටුපළ නිර්මාණ ප්‍රමිතීන්ට අනුකූල බවට පිළිගනු ලැබේ. තවද උක්ත අනුමැතිය මගින් යෝජිත සංවර්ධන කටයුත්ත නිරුපද්‍රිත, ආරක්ෂිත සහ කාර්යක්ෂම එකක් බවට සිවිල් ගුවන් සේවා අධිකාරිය මගින් පිළිගත් බවද අදහස් වේ.

6. තවද ගුවන් තොටුපළ මෙහෙයුම් කටයුතුවල නිරුපද්‍රිතතාව, ආරක්ෂාව සහ කාර්යක්ෂමතාව සහතික කරනුවස් සිවිල් ගුවන් සේවා අධිකාරිය මගින් යෝජනා කරන ඕනෑම අවස්ථාවක උක්ත ගුරු සැලැස්ම වෙනස් කිරීමට ගුවන් තොටුපළ හා ගුවන් සේවා සමාගම බැඳී සිටී.

මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි අනුමත ගුරු සැලැස්මේ පිටපතක් මහජනතාවගේ පරිශීලනය සඳහා කොළඹ 02, හුණුපිටිය පාරේ, අංක 04 දරන ස්ථානයේ පිහිටි සිවිල් ගුවන් සේවා අධිකාරියෙහි පුස්තකාලයෙහි තබා ඇත.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ අණ පරිදි,

එච්. එම්. සී. නිමල්සිරි,
අධ්‍යක්ෂ ජනරාල් සහ
ප්‍රධාන විධායක නිලධාරී.

2013 පෙබරවාරි මස 18 වැනි දින,
කොළඹ 02, හුණුපිටිය පාර,
අංක 4, සිවිල් ගුවන් සේවා අධිකාරියේ දී ය.

03-321

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.